නිපුණතාව 05 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායනය කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 5.1 ශාන්තිකර්ම හා සබැඳි ගායනය ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම 5.1 ශාන්තිකර්ම කවි කියමු.

මඩුපුරේ කවි/ නානුමුර කවි / කොහොඹා හැල්ල කවි/ ග්‍රහ පන්ති කවි

ඉගෙනුම් පල :

- සාම්ප්‍රදායික ගායනවල පසුබිම හා සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ස්වකීය හඬ තලයෙහි පිහිටා නිවැරදි තාල හා නාද රටාවන් අනුව ඒකල ව ගායනය කරයි.
- ඒකීය හඬ තලයක පිහිටා සාමූහික ව ගායනය කරයි.
- මෙම ජාතික උරුමයන් රැක ගැනීම සඳහා විවිධ යෝජනා ඉදිරිපත් කරයි.

ශිෂයා කල යුතු කාර්යයන් -

- අන්තර් ජාලය තුලින් හෝ හඩපට මගින් මෙම ශාන්ති කර්ම කවි ගායනය හා එම නාද මාලාවන් හොදින් ශ්‍රවනය කරන්න.
- ඒ අනුව ගායනා කිරීමට උත්සහ ගන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කර ගත හැකි පොත් පත් / වෙබ් අඩවි හා ඉගෙනුම් ආධාරක**

- 12ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත - ජාතික අධ්‍යාපන ආයතනය
- Youtube https://www.youtube.com/watch?v=mSlxBTSONUI

ඇගයීම්

- නියමිත කවිවල පසුබිම විස්තර කරන්න.
- එක් මාතෘකාවකට එක කවියක් බැගින් ගායනය කරන්න.
- නියමිත නාදමාලාවට අනුව ඒකීය හඬ තලයක පිහිටා කණ්ඩායම් වශයෙන් ගායනා කරන්න.
- බෙර පදයට අනුව තාල තබමින් ඒකල වශයෙන් ගායනය කරන්න.
- මෙම කවි ගායන සංරක්ෂණය සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.

**සඳහන් ඇගයීම් ද සිදු කරන්න.**

- සති පාසල් කාර්‍ය පත්‍රිකා - 12 නර්තනය පළමුවන වාරය A -20

<u>පසු ක්‍රියාකාරකම්</u>

- ඉහත සඳහන් ශාන්තිකර්ම කවි ගායනයෙන් ලගා ගත් ගායන හැකියාව තව දුරටත් සංවර්ධනය කර ගන්න.
- විවිධ නාද මාලාවන් එක් කර ගායනා එකතුවක් සාදා ගන්න. මෙම ගායන සියල්ල එක් කර ගනිමින් සමූහ ගායනා නිර්මාණ අංගයක් සාදා ගන්න.එය සුදුසු අවස්ථාවක ප්‍රේක්ෂක රස වින්දනය සඳහා ඉදිරිපත් කරන්න.

**සැකසුම - එච්. අයි. නීලකාන්ති. ර/ සුමනා බාලිකා විද්‍යාලය . රත්නපුර කලාපය .**